---

**පූනාකරෙයි ප්‍රාදේශීය සභා**

**කිලිනොච්චි දිස්ත්‍රික්කය.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ඔක්තෝබර් 10 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව පූනරින් ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට පූනරින් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළයෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් ගිණුම්වල නිරීක්ෂණය වූ ගිණුම්කරන අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනකම |
| | | රු. | | රු. |
| අඩුවෙන් දැක්විම | 1 | 15,500 | 5 | 222,440 |
| වැඩියෙන් දැක්විම | - | - | 6 | 5,590,000 |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම

ගිණුම් විෂයයන් 09 ට අදාල රු.1,037,829 වටිනා ගනුදෙනු සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරික්ෂණය කළ නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,433,801 ක් වූ අතර ඊට අනුරූපිව ඉතුක් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,728,190 ක් විය.

2.2 අයවැය පාලනය

අයවැයගත හා සත්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කලමනාකරණ පාලන ඒකකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | - | - | - |
| (ii) | බදුකුලී | 1791 | 1353 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 907 | 358 | - |
| (iv) | වෙනත් ආදායම් | 13,977 | 17,195 | 1,700 |

2.3.2 අහිමි වු ආදායම්

සභාබල ප්‍රදේශයේ තිබෙන දේපල තක්සේරු නොකිරිම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුනි.

2.3.3 මුද්දර ගාස්තු

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 214,720 ක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010-2011 කාල පරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු වන රු. 737,774 අයකිරිම පිළිබඳ කටයුතු කර නොතිබුණි.

2.3.4 විදුලි සංදේශ කුළුණු ගාස්තු

2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය පරිදි සභා බල ප්‍රදේශයේ තිබෙන විදුලි සංදේශ කුළුණු 04 ක් වෙනුවෙන් ගාස්තු අයකර නොමැත.

2.4 අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදි නිරීක්ෂණය විය.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1989 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | 111 පරිච්ඡේදයේ 81 වගන්තිය | සෑම කාර්තුවක් අවසානයේදි මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් අයකිරිමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | i. 189 | ආරක්ෂක තැන්පතු වශයෙන් 2012 ජුනි 13 දින සභාවට ලැබූ රු. 66,670 ක චෙක්පත පසුව අගරු වීම පිළිබඳ සභාව විසින් කටයුතු කර නොතිබුණි. |
| | ii. 396 | ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් 2 ක් පිළිබඳ කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ අංක 1722/27 හා 2011 සැප්තැම්බර් 09 දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රය උප වගන්ති 11 | සභාව සතු වාහන 14 ක් සඳහා බලපත්‍ර ලබා ගැනිමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සභාව විසින් සිදුකර නොතිබුණි. |
| (ඉ) | 2012 ඔක්තෝබර් 28 දිනැති අංක 1A1/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ සඳහන් පරිදි පරිගණක හා ඊට අදාල උපාංග පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුනි. |

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 උපයෝජිත නොවූ භෞතික සම්පත්

පූනරින් පොදු වෙළඳ පොලේ ඉදිකිරිම් කටයුතු රු. 4,281,016 ක වියදමෙන් නිම වී අවුරුද්දක් ගතවී තිබුණ නමුත් එම වෙළඳ පොල ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් ආදායම් උපයා ගැනීමට අපොහොසත් වී තිබුනි.

2.5.2 නොපවරන ලද වාහන

සභාවේ ප්‍රයෝජනයට පරිත්‍යාග කරන ලද වාහන 14 පවරා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.6 ලැබිය යුතු ගිණුම්

ගිණුම්වල දිගින් දිගටම දක්වූ තිබූ රු. 188,255 ක ආදායම් ණයගැතියෝ මෙම වාර්තාවේ දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.7 ක්‍රියාත්මක නොකළ සැලසුම්

ප්‍රජා මධ්‍යස්ථාන වලට පරිත්‍යාග

(අ) සභා බල ප්‍රදේශයේ තිබෙන ප්‍රජා මධ්‍යස්ථාන වලට අදාල පරිත්‍යාග භාර දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රජා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමට හා නඩත්තු කිරීම සඳහා රු.262,068, 2010 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලබාදී තිබුනි. කෙසේ වෙතත් එවැනි වැඩිදියුණු කිරීම් කටයුතු හෝ නඩත්තු කටයුතු කිසිවක් මෙතෙක් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් එකතු කිරිම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) පරිත්‍යාග
(ඉ) විවිධ තැන්පත්
(උ) ගබඩාව
(ඊ) අයවැය ලේඛනය